# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2074/39 - 2018 ජුනි මස 08 වැනි සිකුරාදා - 2018.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින්

(අ) එම වගන්තිය යටතේ පනවන ලද 2018.02.15 වැනි දිනැති අංක 2058/34 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධිත 2017.11.09 වැනි දිනැති අංක 2044/32 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද උපලේඛනය (II) හි සඳහන් අයිතම අංක 1 (ආ) හා 1 (ඇ) පහත උපලේඛනය අ පරිදි ද ; සහ

(ආ) එම වගන්තිය යටතේ පනවන ලද 2018.02.15 වැනි දිනැති අංක 2058/34 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධිත 2017.11.09 වැනි දිනැති අංක 2044/32 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද උපලේඛනය (II) පහත උපලේඛනය ආ පරිදි ද ;

සංශෝධනය කරමි.

මෙය 2018 ජුනි මස 09 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018.02.15 වැනි දිනැති අංක 2058/34 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත නියෝගය 2018 ජුනි මස 09 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි මෙයින් අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 ජුනි මස 08 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය අ**

| අංකය | විස්තරය | නිෂ්පාදන බද්ද |
|---|---|---|
| (ආ) | රජයේ නිලධාරියකු විසින් 2018.02.15 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 හෝ/සහ එයට යා කරන ලද සංශෝධන වලට අනුව නිකුත් කරන ලද සහනදායි බලපත්‍රයක් උපයෝගී කරගෙන, | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 3.6 ක් අඩු කිරීම |
| (ඇ) | විදේශ දූත මණ්ඩලයන්හි සේවය කරන ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන් විසින් 2016.10.31 දිනැති අංක 210 (III) දරන චක්‍රලේඛය හෝ/සහ එයට යා කරන ලද සංශෝධන වලට අනුව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 3.6 ක් අඩු කිරීම |

**උපලේඛනය ආ**

2018.02.15 වැනි දිනැති අංක 2058/34 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත 2017.11.09 වැනි දිනැති අංක 2044/32 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ උපලේඛනය (II) හි අයිතම අංක 4 ට පසු පහත සඳහන් අයිතම ඇතුළත් කරමින්,

| අංකය | විස්තරය | නිෂ්පාදන බද්ද |
|---|---|---|
| 5. | රජයේ නිලධාරියකු විසින් 2018.02.15 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 අනුව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, 2018 ජුනි 08 වැනි දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කර සහ 2018 දෙසැම්බර් මස 31 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කර ගන්නා ලද ආනයනය කරන ලද වාහනයක් සඳහා | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 5.0 ක් අඩු කිරීම |
| 6. | රජයේ නිලධාරියකු විසින් 2016 ඔක්තෝබර් 31 දිනැති අංක 210 (III) දරන චක්‍රලේඛය සහ එයට කරන ලද සංශෝධන අනුව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, 2018 ජුනි 08 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කර සහ 2018 දෙසැම්බර් මස 31 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කර ගන්නා ලද ආනයනය කරන ලද වාහනයක් සඳහා | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 5.0 ක් අඩු කිරීම |

06 - 1014

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.